රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2014

මගේ අංකය : EST-7/LEAVE/03/3162
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.05.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. විදේශ ශිෂ්‍යත්ව මත උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගත වන රාජ්‍ය නිලධරයෙකුගේ රාජ්‍ය සේවයේ නියුතු කලත්‍රයාට ද අදාළ නිලධරයා සමඟ විදේශ ගත වීම සඳහා ඉහත වගන්තියේ විධිවිධාන පරිදි වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දීමට 2014.02.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තියට 16:1:9 හා 16:1:10 වශයෙන් පහත උප වගන්ති ඇතුළත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

16:1:9 මෙම පරිච්ඡේදයේ 14 වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය අනුග්‍රහය ඇතිව විදේශ ශිෂ්‍යත්ව සඳහා විදේශ ගත වන රාජ්‍ය නිලධරයෙකුගේ රාජ්‍ය සේවයේ නියුතු කලත්‍රයාට අදාළ නිලධරයා සමඟ විදේශ ගත වීම සඳහා වැටුප් රහිත නිවාඩු පහත සඳහන් කොන්දේසියට යටත්ව ලබාදිය හැක.

16:1:9:1 කලත්‍රයාට වීසා ලැබී නොමැති අවස්ථාවල දී ඔහුට / ඇයට අදාළ රටට ඇතුළුවීම සඳහා වීසා ලබා ගැනීමට මෙම සහනය අනිසි ලෙස භාවිතා නොකළ යුතුය.

16:1:10 විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීමේදී සඳහන් වන 16 වගන්තියේ අනෙකුත් කොන්දේසි සියල්ලක්ම 16:1:9 උප වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන විට ද අදාළ වනු ඇත.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය